# 2. මෙහෙයුම් පද්ධතිය භාවිතයෙන් පරිගණකයක් වින්‍යාස කිරීම සහ සිටුවම් කිරීම.

## පරිගණක වල හට ගන්නා මූලික දෝෂ

පරිගණක වල හට ගන්නා මූලික දෝෂ වර්ග දෙකකි.

1. දෘඩාංග දෝෂ
2. මෘදුකාංග දෝෂ

## පරිගණක කෙවෙනි වර්ග

1. PS2 කෙවෙනිය



මූසිකය සහ යතුරු පුවරුව පරිගණකයට සම්බන්ධ කිරීමට යොදා ගනී .

2. VGA කෙවෙනිය



VGA සම්බන්ධකය සහිත සංදර්ශක සදහා යොදා ගනී.

3. DVI කෙවෙනිය



DVI සම්බන්ධකය සහිත සංදර්ශක සදහා යොදා ගනී.

4. HDMI කෙවෙනිය




සංදර්ශකය සදහා රූපවාහිනිය සම්බන්ධ කිරීමට යොදා ගනී.

5. USB කෙවෙනිය




මූසිකය, යතුරු පුවරුව, මුද්‍රණ යන්ත්‍රය ආදී සම්බන්ධකය සහිත උපාංග සම්බන්ධ කිරීමට යොදා ගනී කිරීමට යොදා ගනී.

6. RJ45 කෙවෙනිය



පරිගණක ජාලගත කිරීමට භාවිත කරයි

7. eSata කෙවෙනිය



බාහිර ආචයන උපාංග සම්බන්ධ කිරීමට යොදා ගනී.

8. HD Audio කෙවෙනිය



මයික්‍රොෆෝන, ස්පිකර,ඉස්බනු සම්බන්ධ කිරීමට යොදා ගනී

9. Parallel කෙවෙනිය



මුද්‍රණ යන්ත්‍රය සම්බන්ධ කිරීමට යොදා ගනී කිරීමට යොදා ගනී.

10. Micro USB කෙවෙනිය



ජංගම දුරකථන, MP3 ධාවක ,ඩිජිටල් කැමරා සම්බන්ධ කිරීමට යොදා ගනී කිරීමට යොදා ගනී.

11. SD CARD READER



SD CARD කියවීම සඳහා යොදා ගනී. LAPTOP, TAB ආදියේ දක්නට ලැබේ.

<u>දෘඩාංග දෝෂ සඳහා උදාහරණ</u>

- මූසිකය ක්‍රියාත්මක නොවීම.
- යතුරු පුවරුව ක්‍රියාත්මක නොවීම.
- පරිගණකය ක්‍රියාත්මක නොවීම.
- සංදර්ශකය ක්‍රියාත්මක නොවීම.
- නාදකය ක්‍රියාත්මක නොවීම.

<u>මෘදුකාංග දෝෂ</u>

මෘදුකාංග දෝෂ වර්ග දෙකකි.

1. යෙදුම් මෘදුකාංග දෝෂ
2. මෙහෙයුම් පද්ධතියේ ඇතිවිය හැකි දෝෂ

<u>යෙදුම් මෘදුකාංග දෝෂ</u>

යෙදුම් මෘදුකාංග යනු යම්කිසි කාර්යක් පරිගණකය හරහා ඉටු කර ගැනීමට භාවිතා කරන මෘදුකාංගයි.
උදා: MS Word, MS Excel, Paint

<u>යෙදුම් මෘදුකාංග සඳහා උදාහරණ</u>

- ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම.
- ක්‍රියාත්මක වුවද ප්‍රතිචාර නොදැක්වීම.

- Open වීමට බොහෝ වෙලාවක් ගත වීම.
- මන්දගාමී වීම.
- පරිශීලක විධාන මත ක්‍රියාත්මක නොවීම.

**<u>මෙහෙයුම් පද්ධතියේ ඇතිවිය හැකි දෝෂ</u>**

මෙහෙයුම් පද්ධතිය ආශ්‍රිතව ඇතිවන දෝෂ මෙසේ හඳුන්වයි.

**<u>මෙහෙයුම් පද්ධතියේ ඇතිවිය හැකි දෝෂ සඳහා උදාහරණ</u>**

- මන්දගාමී වීම.
- පරිගණකය ආරම්භ වීමට බොහෝ වෙලාවක් ගත වීම.
- පරිශීලක විධාන මත ක්‍රියාත්මක නොවීම.

**උපදෙස් :**
**වැඩ පොතේ 10 පිටුවෙහි ඇති හිස්තැන් පිරවීමේ අභ්‍යාසය, ක්‍රියාකාරකම 2.4, ක්‍රියාකාරකම 2.5 කරන්න.**